කොවිඩ් ව්‍යාප්තිය




★


# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමිණ




කාලතුලේ ඩිජිටල් දොරටුව ද්වාර අද පත්‍රය සමඟ


ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ උඳුවප් අව විසේනිය තිථිය ලත් සඳු දින | කාණ්ඩය 112 | පත්‍රය 16 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත්පතකි | 2021 ජනවාරි 04 සඳුදා


# ජාතික ආරක්ෂාව - ආර්ථික සංවර්ධනය ඒකාබද්ධ කළ ස්ථිරසාර විදේශ ප්‍රතිපත්තියක්

ධනුෂ්ක ගොඩකුඹුර

ජාතික ආරක්ෂාව සහ ආර්ථික සංවර්ධනය ඒකාබද්ධ කොට ගත් ස්ථිරසාර විදේශ ප්‍රතිපත්තියක් රටට හඳුන්වාදීමට රජය සැරසෙයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ මෙතෙක් අනුගමනය කරන ලද දේශපාලනමය රාජ්‍ය තාන්ත්‍රික මාවත ආර්ථිකමය රාජ්‍ය තාන්ත්‍රික මාවතක් වෙත යොමු කෙරෙන "2020 සහ ඉන් ඔබ්බට ප්‍රධාන විදේශ ප්‍රතිපත්ති නියෝග" මේ වන විට සකසා ඇති බව රජයේ ආරංචි මාර්ගයක් ප්‍රකාශ කළේය. පිට 06

## රාජ්‍ය - පෞද්ගලික ආයතන රැසකින්

# දැව සංස්ථාවට කෝටි 115ක් පොල

බුද්ධි කරුණාරත්න

රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ විවිධ ආයතන සහ පුද්ගලයන්ගෙන් 2016 වසරේ සිට මේ දක්වා රාජ්‍ය දැව සංස්ථාවට අය විය යුතු මුළු හිඟ මුදල රුපියල් මිලියන එක්දහස් එකසිය හතළිස් හයක් බව වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය වෙත ලැබී ඇති මූල්‍ය වාර්තාවකින් හෙළි වී තිබේ.

එම වාර්තාව සම්බන්ධයෙන් අමාත්‍යාංශය නිකුත් කර ඇති මාධ්‍ය නිවේදනයක සඳහන් වන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට සිල්පර කොට සැපයීම වෙනුවෙන් රුපියල් මිලියන නවසිය හත-ළිහක් ද, ශ්‍රී ලංකා විදුලි බල මණ... මිලියන හතළිහක් ද, මිනුම් ඒකක... දෙපාර්තමේන්තුවෙන් රුපියල්... මහවැලි අධිකාරියෙන් රුපියල්... ද, රුහුණු විශ්වවිද්‍යාලයෙන් මි... සර අමාත්‍යාංශයෙන් රුපියල්... ලංකා වරාය අධිකාරියෙන් රුපි... ද, ආරක්ෂක අමාත්‍යාංශයේ ව්‍ය... රණ ඒකකයෙන් මිලියන 2.8ක්... ර්තමේන්තුවෙන් මිලියන 2.7ක්... ලේකම් කාර්යාලයෙන් මිලියන...




# පිටරට සිට මෙරට මත් ජාවාරම මෙහෙයවන 18ක් හඳුනා ගනියි



...පෙරේරා

...රටවල සිටිමින් ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ...රය මෙහෙයවන ප්‍රධාන පෙළේ මත්කුඩු ...යන් 18 දෙනකු පිළිබඳ කරුණු හෙළි ...මට මෙරට බුද්ධි අංග සමත්ව තිබේ. එම ...් මෙරට සිටින විවිධ පුද්ගලයන් සම්බ-න්ධ කර ගනිමින් සිදු කරන මේ මහාපරිමාණ මත්ජාවාරම සම්පූර්ණයෙන්ම මැඩලීම සඳහා නව වසරේදී විශේෂ වැඩපිළිවෙළක් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය ක්‍රියාත්මක කර ඇති අතර ඔවුන් අත්අඩංගුවට ගැනීමට ද ක්‍රියාත්මක වී සිටී. පිට 06



## 'සේනා' මර්දනයට රුවන්ඩාවේ බෙහෙත් බෙදුවේ නෑ

පිට 06



## මුස්ලිම් මෘතදේහ ආදාහනය ද භූමදානය ද ගැන වගකීම ජනපති ගත යුතුයි

පිට 06



## පළාත් පාලන මැතිවරණයට සූදානම් විය යුතුයි

පිට 06



## ශ්‍රී ලංකාවට පළාත් සභා

පිට 06

# අත්‍යවශ්‍ය ආහාර වර්ග 10ක මිල ස්ථාවර කරයි

සුභාෂිණී සේනානායක සහ අනුර ප්‍රේමලාල්

පාරිභෝගික ජනතාවට අත්‍යවශ්‍යම ආහාර වර්ග 10ක් පෙබරවාරි මාසයේ සිට ස්ථාවර මිලකට ලබාදීමට පියවර ගන්නා බව වෙළෙඳ අමාත්‍යාංශය පවසයි. හාල්, පිටි, සීනි, පරිප්පු, ටින්මාළු, හාල්මැස්සන්, ලූනු, ආර්තාපල්, බිත්තර හා කුකුළු මස් යන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය 10 ස්ථාවර මිලක් යටතේ ලබාදීමට නියමිත බව කියා සිටි වෙළෙඳ අමාත්‍යවරයා සතොස සමුපකාර සහ කිවි ෂොප් ජාලය මඟින් මෙම සහනය ජනතාවට සලසන බව ද කියා සිටියේය. පිට 06

## මධ්‍යම ආදායම්ලාභීන්ගේ නිවාස ගැටලුවට විසඳුම්

# නිවාස ඒකක 5000ක් සෑදීමේ සමාරම්භය අද

චමීර ඇල්ලදෙණිය

'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව මධ්‍යම ආදායම්ලාභී පවුල් වෙනුවෙන් ඉදිකරන නිවාස ඒකක 5000 වැඩසටහනේ ආරම්භක පියවර ලෙස නිවාස 3000ක් ඉදිකිරීම ඔරුගොඩවත්තේදී අද (4) ආරම්භ කිරීමට නියමිතය. පිට 06

## ඉදිකිරීම් ක්ෂේත්‍රයට ජාතික ගොඩනැගිලි සංග්‍රහයක්

ධනුෂ්ක ගොඩකුඹුර

ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා ජාතික ගොඩනැගිලි සංග්‍රහයක් පිළියෙල කෙරේ. 2021 අය-වැය මඟින් ඒ සඳහා රුපියල් ලක්ෂ 1591ක් වෙන් කිරීමට රජය තීරණය කර තිබේ. පිට 06

## බස්නාහිරින් පිට වන තැන් 11කදී ආසාදිතයෝ 103ක්

පිට 06

## රඹෑව හා වැලිකන්ද ප්‍රාදේශීය සභා සභාපති තනතුරු අත්හිටුවයි

අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක

රඹෑව සහ වැලිකන්ද යන ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් දෙදෙනාගේ ධුරයන් උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා විසින් මාස තුනකට තාවකාලිකව අත්හිටුවාලීමට පියවර ගෙන ඇත.

## නීතිවිරෝධිව ඩුබායි යෑමට තැත් කළ අංගොඩ ලොක්කාගේ